ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2012 අගෝස්තු 13 සඳුදා
04 වෙළුම - 42 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00






## වන්නි මඩු සිද්ධස්ථානය කරා වන්දනා ගමනක්

ඡායා : තිසර

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# කතෝලික සාසන ඉතිහාසය පුංචි ඔබත් මැනවින් දත යුතුයි.

**ආදරණීය දුවේ පුතේ...**

මෙවර ''ළමා ප්‍රදීපය '' පුවත්පත ඔබ අතට නවතම විශේෂාංගයක් ඉදිරිපත් කරනවා. මෙම විශේෂාංගය මේ සතියේ පටන් හැම කලාපයකම පළ කරනු ලබනවා. ''සිරි ලක් කිතු සසුන'' මැයෙන් ගරු තිමති කොලමුන්නෙ පැ.තු.නි. පියතුමා විසින් දරුවන් උදෙසාම ලියන ලද සංක්ෂිප්ත සටහන් මෙලෙස ඔබ අතට පත් කරන්නේ අපේ කතෝලික සාසනය පිළිබඳව හැම කෙනෙක්ම හොඳින් හැදැරිය යුතු නිසයි.

ආදර දුවේ පුතේ, අපේ කතෝලික සාසන ඉතිහාසය වසර 500 කට වඩා අතීතයකට දිව යන්නක්. අද යම් මතයක් පැන නැගී තිබෙනවා අපේ සිරිලක් කතෝලික ඉතිහාසයට දුර ඈත අතීතයක් නැතෙයි කියා. එය සාවද්‍ය මතයක්. අනුරාධ පුරයුගයේ සිට මේ සිරි ලක තුළ කතෝලික සසුන පැවතුනා. සීගිරි වෘතාන්තය තුළ අනිවාර්යයෙන්ම කිතුනු ආභාෂය පැවති බව සිරිලක පහළ වූ අග්‍රගන්‍යයේ පුරා විද්‍යා කොමසාරිස් වරයකු වූ මහාචාර්ය සෙනරත් පරණවිතාන පවා සිය ලිපි ලේඛන මගින් ඔප්පු කොට පෙන්වා දී තිබෙනවා.

මෙලෙස අප රටේ පැවති මේ කිතුනු දහම නැවත දළුලා වැඩුනේ පෘතුගීසි සමයේ කතෝලික ධර්මදූතයන්ගේ පැමිණීමත් සමගමයි. අද පැවතෙන විශාල දුර්මතයක් තමයි, පෘතුගීසින් මෙරටට පැමිණියේ ආගම් ප්‍රචාරයකට බව. නමුත් මෑත කාලීන සත්‍ය විමර්ශණ තුළ හොඳින්ම පෙන්වා දී තිබෙනවා ඔවුන් මෙරටට පැමිණියේ දහම් ප්‍රචාරයකට නොවන බව. 1506 සිට වසර 50 ක් තුළ කිසිදු ධර්මදූත ව්‍යාපාරයක් රට තුළ සිදුවී නැහැ. නමුත් අර පෙර කල සිටි සිරිලක් කතෝලිකයන්ගේ පිබිදීමකට ඒ ආභාෂය යම් පිටිවහලක් වී තිබෙනවා, ශා. තෝමස් අපොස්තුළුවරයාගේ අනුගා මිකයන් ඉන්දියාවේ කේරල ප්‍රාන්තයේ හා තමිල් නාඩු ප්‍රාන්තයේ සිට පැමිණ ඉන්දීය ආභාෂයෙන් පෙර දිග දහම් නවෝදයක් ඇති කර තිබූ නිසාත් පෘතුගීසින් කතෝලික ලබ්ධිකයන් වූ නිසාත් ඒ සියලු ශක්තියෙන් මුහුදු බඩ පළාත් වල නැවතත් කතෝලික දහම් ව්‍යාප්තිය සිදු වූවා.

ආදර දුවේ පුතේ, ආභාග්‍යයකට අපේ පාසල් පොත් වල බොහෝ අවස්ථාවලදී මෙම සත්‍ය පින්තූරය විකෘති කොට තමයි හුවා දක්වා තිබෙන්නේ. එම නිසා පාසල් වල ඉතිහාසය ඉගෙන ගන්නා විට කතෝලික සසුන අරභයා එහි පළ වන යම් අසත්‍ය කරුණු වලට සත්‍ය කරුණු වලින් උත්තර සපයන්න ඔබ මැනවින් මෙම සසුන් ඉතිහාසය හදරා තිබිය යුතුයි. විවිධ යුග වලදී සිදුවූ පෙරළීන් ඇසුරෙන් සිදු වුයේ කුමක්ද යන්න දැන ගත යුතුයි.

ඔබට මතක ඇති මෑතකදී පාසල් පෙළ පොත්වල ඉතිහාසය සම්බන්ධයෙන් එළි දැක්වූ කරුණුවලදී බොහෝ විට කතෝලික සසුන් ඉතිහාසය ගැන යම් අපැහැදිලි දසුනක් ඇති කර තිබුනා බව. සිරිලක් ඉතිහාසය පමණක් නොවෙයි ලෝක කිතුනු ඉතිහාසය ගැනත් බොහෝ සාවද්‍ය කරුණු ඇතුලත් කොට තිබුන ඒ පිළිබඳව පැහැදිලි හඩක් නගා එම කරුණු නිවැරදි කරන්නට උත්සාහ කෙරුවත් තවමත් යම් යම් කරුණු අරභයා ප්‍රශ්න තිබෙනවා. නිවැරදි පාරිභාෂිත වචන යොදා ගැනීම තවමත් ඉතිහාස පෙළ පාඩම් වල ඉතා අඩුයි. ඉතින්, ඔබ මේ සසුන් ඉතිහාසය නිවැරදිව හදරමින් නිවැරදි පාරිභාෂිත වචන යොදා ගන්නට සසුන් මග හදරා තිබෙනවා නම් එය ඔබේ අවබෝධයට හා දැනුමට මෙන්ම කතෝලික දහම් ප්‍රබෝධයට ඉමහත් සේ ඉවහල් වෙනවා.

එම නිසා ආදර දුවේ, පුතේ, ළමා ප්‍රදීපය පුවත් පතේ පළවන මේ පාඩම් පෙළ හොඳින් හදරන්න. එය එකතු කරන්න. හැම කතෝලික දරුවෙක්ම තමන්ගේ දේශයේ ඉතිහාසය මෙන්ම කතෝලික සභාවේ ඉතිහාසයත් දැන ගත යුතුයි. මෙහිදී කතෝලික සසුන් ඉතිහාසය පුරා පෙර අපරදිග අතීත කථා තුළින් මෙතුවක් සභාව ආ ගමන් මග පිළිබඳව දැනුවත් වෙන විට දුර්මත විහිදුවන්නන්ට විරුද්ධව පුංචි ඔබටත් පුලුවන් සත්‍ය කරුණු ඉදිරිපත් කරන්නට පෙළ ගැසෙන්න. එය සිදු විය යුත්තක්මයි.

එම නිසා පාසලේ පංති කාමරයෙන් පමණක්, දහම් පාසලෙන් පමණක් නොව මෙවන් හැදෑරීම් තුළින්ද මෙවන් කරුණු පිළිබඳව හොඳ නිපුණතාවක් ඇති කර ගන්නට ලැබෙන ඉඩ ප්‍රස්ථා අහක දමන්න එපා. පිළිවෙතින් මේ සසුන් මග හදරන්නට ඔබට පිළිවන්. ඒ දැනුම හා පරිචය ලබා ගන්නට පෙරමග සුදනමක් සේ ඔබ අතට පිදෙන මේ තිළිණය ඔබ ඉත සිතින් භාර ගනු ඇති බව අපගේ නොමඳ බලාපොරොත්තුවයි.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**

# සිරිලක් කිතු සසුන් ඉතිහාසය - 1

## සාන්ත තෝමස් අපෝස්තුළුතුමා සහ ඉන්දියාව

ඉන්දියාව සහ පකිස්ථානය යන රටවල ක්‍රිස්තියානි ආගම පැතිර ගියේ කෙසේ ද කියා සොයාබැලීමට කරන ලද ගවේෂණයකින් පසු ''ඉන්දියාවේ සහ පකිස්ථානයේ ක්‍රිස්තියානි ආගම'' යන මැයෙන් පොතක් නිකුත් කිරීමට , එංගලන්තයේ පී.තෝමස් නැමැති ඉතිහාසඥයාට හැකි විය 1954 දී මුද්‍රණයෙන් පිටවූ මේ ග්‍රන්ථයෙහි ඇතුළත් තොරතුරු තුලනාත්මක විමසුමකට භාජනය කළ යුතු වේ.



**සා. තෝමස් අපෝස්තුළුතුමා**

එම ග්‍රන්ථයෙහි එන විස්තර අනුව තෝමස් අපෝස්තුළු තුමා තම සුභාරංචිය දෙසීමට ඉන්දියාවට පැමිණ තිබේ. ඒ කාලයේ වයඹදිග ඉන්දියාවේ බලවත්වූ රජතුමා වූයේ ගොණ්ඩෝපෝරෙස් නමැත්තාය. ඔහුගේ කීර්තිය පාර්තියා දේශය, බටහිර දිග ඉන්දියාව, සිරියාව සහ මධ්‍යධරණී මුහුද ආශ්‍රිත ප්‍රදේශ වලද පැතිර ගොස් තිබිණ, සාන්ත තෝමස් මුනි ඉන්දියා දේශයට පැමිණෙන විට බෞද්ධාගම ඉන්දීය දේශයේ පැතිර ගොස් තිබුණ බව සඳහන්වේ. එද දකුණු ඉන්දියාවේ ප්‍රසිද්ධ වරාය වූයේ ''මුසිරිස්'' යන ස්ථානයයි. අද එය ''ක්‍රැන්ගනූර්'' වශයෙන් හඳුන්වනු ලැබේ. මලයාලි බසින් ''මයුරි කොට්ටා''නමින්ද ව්‍යවහාරයි මේ වරායේ විවිධ ජාතීන්ගේ වෙළඳ පොළවල් විය. නැව් නිතරම නොපැමිණෙන හෙයින් බඩු ගබඩා තැනින් තැන දක්නට තිබුණි. මුතු, මැණික්, ඇත්දත්, සිල්ක්, කුළුබඩු, ගම්මිරිස් මේ වරායෙන් පිට යැවූ වෙළඳ ද්‍රව්‍යයන් ය.

රෝමයේ ඔගස්ටස් සීසර් අධිරාජයා වශයෙන් පත්වූ විට ඉන්දියාවේ පාණ්ඩ්‍ය රජ , සීසර් නම් රෝම රජුට සුබ පැතීමට තානාපතියකු යැවූ බවද සඳහන් වේ. රෝම රජු ඉන්දියාවේ මුසිරිස් නගරයේ රෝම භටයන්ගෙන් යුත් කඳවුරක් පිහිටුවනු ලැබුවේ එහි සිටි රෝමන් ජාතිකයන්ගේ ආරක්ෂාව පිණිසය. මෑතකදී රෝම කාසි මදුර නගරයේදී හමුවී ඇත. සා. තෝමස් මුනිවරයා ඉන්දියාවට එන කාලයේ ''මුසිරිස්''නග රයේ රෝම දේවතා දේවාලයක් තිබුණු බව ඉතිහාසගතයි. ඒ යුගයේ දකුණු ඉන්දියානුන් නැව් කර්මාන්තයේ දක්ෂයන් වූ හෙයින් අරාබි , සිරියන් , පර්සියන් නැව් ඉන්දියානු වරායවල නිතර නිතර දර්ශණය විය.

සා. තෝමස් තුමා චේර (කේරල) රටේ දේශනා කරද්දී එම රටේ පාලකයා වූයේ පෙරුමාල් නැමැක්කා ය. ඔහු ක්‍රිස්තියානි ආගම වැළඳගත් බව ව්‍යවහාරයේ තිබුණත් ඊට සාක්ෂි නැත. එහෙත් ඔහුගේ ඥාතීන් ක්‍රිස්තු ආගම වැළඳගත් බවට සාක්ෂි තිබේ. පෙරුමාල්ගේ රටේ හින්දු, ජෛන, බෙ?ද්ධ යන ආගම් ඇදහූ අය සිටියහ. තමන්ට කැමති ආගමක් ඇදහීමේ නිදහස එහි තිබුණේය. සා. තෝමස් තුමා මලබාරයේදී පළමුවෙන් දේශනා කර ඇත්තේ ජූද ජනයාටයි. ඉන්පසු සාමාන්‍ය ජනයාද එතුමාගේ දෙසුම් වලට සවන් දුන්හ. මේවායේ ප්‍රතිඵල පුදුම එලවන සුලු බව ප්‍රකාශ වේ.

### බ්‍රාහ්මණයන් ආගම වැළඳගැනීම

ක්‍රිස්තුන් වහන්සේ තුළ පුදුමාකාර විශ්වාසයක් ඇති, සා. තෝමස් මුනිවරයා තම ස්වාමීන් වහන්සේගේ ලයට අත තැබූ ඇඟිල්ලේ ''රත'' මැරෙන තුරුම තිබුණු බව පුරාවෘත්තයකි. ඉන්දියාවේ බ්‍රාහ්මණයන් අතුරෙන් පළමුවෙන්ම ක්‍රිස්තු ආගම වැළඳගත්තේ ''චේරා ''නැමැති ගෝත්‍රයයි. බ්‍රහ්මණ ජනයා හිමිදිරියේම අවදිවී වේද නීතියට අනුව පවිත්‍රවීම සඳහා ජලස්නානය කරති. ඒ අතරේදී ඔව්හු වේදපාඨ පිරුවති. තවද, වතුර අහුරු රැගෙන උඩට විසි කරති. මේ චාරිත්‍ර දුටු සා. තෝමස් තුමාට දැනගන්නට ලැබුණේ එලෙස වතුර අහුරු උඩට දැමීම පූජාවක් බවයි.

සා. තෝමස් මුනි ඔවුන් සමග කථාවට වැටුණේය. ඔවුන් ඉහළට විසිකරන ජලය ආපසු බිමට වැටෙන හෙයින් ඒවා පූජාවක් නොවන බව කියා සිටියේය. එතුමාගේ තර්කය වූයේ එම ජලය දෙවියන්පිළිගන්නේනම් ඒවාබිමට නොවැටෙන බවයි. එවිට බ්‍රාහ්මණ පිරිස මේ ජලය උඩදී

**කිතුනු ඉතිහාසය ඉගෙන ගනිමු**

## සිරිලක් කිතු සසුන

ගරු තිමති කොළඹමුන්නේ පැ.තු.නි. පියතුමා

රැඳී තැබීමට කාට පුළුවන්ද? ඔබටවත් පුළුවන්දැයි? ප්‍රශ්න කළහ. ඔවුන්ට තමා කියන දේට පොරොන්දු වන්නේ නම් තමා මේ ජලය උඩ රඳවන බව කියා සිටියේය. බ්‍රාහ්මණයෝ එකිනෙකා දෙස බලා ගත්හ. පොරොන්දු විය යුතු දේ ගැන ඇසූහ.

ඔවුන් ක්‍රිස්තුන් වහන්සේ අදහන්නේ නම් එය ඉටු කරන බව නැවතත් කීය. ඔවුහු එකවරම පොරොන්දු වූහ. සා. තෝමස් තුමා යාච්ඤා කළේය. වතුර ඉහළ දමන්නට නියම කළේය. එවිට වතුර බිංදු තැනින් තැන බිමට නොවැටී ඉහළ දිළිසෙමින් තිබිණි. මේ දුටු බ්‍රාහ්මණයන් බොහෝමයක් ක්‍රිස්තු ආගම වැළඳ ගත්හ. සා. තෝමස් තුමා දෙව්මැදුරු හතක් තනා තිබේ . ක්‍රැංගනූර්, ක්විලෝන්, පරූර්, නිරානම්, කයිල්, පලූර්, යන ස්ථානවලයි. මේවා පසුකාලයේ සතුරන් අතින් විනාශ වුවද නැවතත් ගොඩ නගනු ලැබීය.

**ලබන සතියට**

පසුගියදා බප/මීග/ දළුපත මහ විදුහලේ දරු දැරියන් 42ක් දළුපත ශු. අන්තෝනි දෙව්මැදුරේදී මීසම් සේවක ගරු ජුලියන් ක්‍රිස්ටෝපර් මීසම් සහයක ගරු සජිත් අරුණ පියතුමන්ලාගේ සහභාගීත්වයෙන් පැවැත්විනි. මෙම අවස්ථාවට දළුපත මහ විදුහලේ විදුහල්පති නියෝජ්‍ය විදුහල්පති තුමිය හා ප්‍රාථමික අංශ භාර ගුරුතුමියද සහභාගී වුණි. ගරු පියතුමන්ලා දරුවන් පුහුණු කිරීම් භාරව සිටි ගුරු භවතුන් පාසලේ ප්‍රධානීන් සමග දිව බොදුන් ලැබූ ළමුන් සමූහ සේයා රුවකට පෙනී සිටි අයුරු **(නිශාන්ත රෝසා)**





මල්පිටිය දේවස්ථානයට අයත් දරුවන් 13 ක් පසුගියදා දිව බොදුන් ලැබූහ. මල්පිටිය මීසම් සේවක ගරු ජෝර්ජ් ලින්ටන් පෙරේරා මීසම් සහයක ගරු පැට්‍රික් රතුගම යන පියතුමන් දහම් ගුරු භවතුන් සමග දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ ළමෝ සමූහ ජායාරූපයකට මෙසේ පෙනී සිටියහ.




වැලිවිට ''සුනිමල'' දහම් පාසලේ සිසු සිසුවියන් පනස් අට දෙනෙකු පසුගියදා වැලිවිට ශාන්ත මරියා දේවස්ථානයේදී ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගන්නා ලදි . දේව මෙහෙයෙන් පසු ගරු මීසම් සේවක හා සහයක පියතුමන්ලා පැවිදි සොයුරියන් සමග ළමා ප්‍රදීපය සඳහා සේයාරුවකට මුහුණ දුන් අයුරු. **(එම්.ජෝ. පාරිස්)**



# ස.ළ.නි. ළමුන්ගේ හැකියාවන්





සාන්ත ආනා ළමා නිවාස (ස.ළ.නි.) වාර්ෂික මංගල්‍යය සහ 19 වන සංවත්සර උත්සවය පසුගියදා තුම්මෝදර ළමා නිවාස යේදී හලාවත රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහිදී ස.ළ.නි. දරුවන් විසින් ඉදිරිපත් කරන ලද විවිධ ප්‍රසංගය උත්සවයට සහභාගි වූ කාගේත් සිත් බැඳ ගත්තේය. මෙහි විචිත්‍රත්වය ළමා ප්‍රදීප කැමරා කාචයේ සටහන් වී තිබූ අයුරු.

සේයා :- ගොඩ්ෆ්‍රි අබේසේකර සටහන:- ප්‍රියන්ත පීටර්ස්

## වඩින්න ජේසුනි මා හද තුළට



දිව්‍ය සත්ප්‍රසාදයේ ජීවමානව වැඩ සිටින මා ආදර ජේසු සමිඳුනි, පුංචි මා හද තුළ ඔබ වහන්සේට සැමද වැඩසිටින්නට ආදරයේ කුටියක් මා සූදානම් කළා. වඩින්න ජේසුනි පුංචි මා හද කුටිය තුළට මගේ ජිවිතයට මා ලබන උතුම්ම වස්තුව ඔබයි, සමිඳුනි ජේසුනි, මාගේ සැම හුස්මක් සමගම මම ඔබ වහන්සේට තුති පුදනවා අදත් , හෙටත්, සැමදමත්, ලෝකයේ සැම දෙනාම වෙනුවෙන්

**මම ඔබේ පුංචි යාලුවා**
**(ඉවෝන් අමරසේකර)**

## ආදර මඩු මව්නි....



විෂකුරු සර්පයන් අලි කොටි
වලසුන් වෙසෙන
බිමේ සිටිනා අම්මා
මලිති බටිති කොවුල් හඬින්
පිනවෙයි සැම දින අම්මා
හඬා වැටෙන කඳුලු සලන
සැමට සරණ වන අම්මා
ලෙඩින් දුකින් පීඩිත වූවන්ගේ
ඉල්ලීම් ඉටුකරනා අම්මා

ජපමාලයෙන් වටකර අප
රකිනා අම්මා
සාමයේ සුවඳින් ලොව සුවඳ
කළ පුතුගේ අම්මා
ඔබතුමී පුදන්න වැඳවැටෙන්න
බැහැදකින්න මහ
ජන කායක් එන දින ළඟයි අම්මා
මරදු මඩුනම් නම් ලැබූ අපේ ආදර මඩු මව් ඔබ වේ අම්මා.

**ශ්‍රීයාන් මධූෂ තිසේරා**
**07 ශ්‍රේණිය**
**ලූර්දු දේව මාතා දහම් පාසල - නාත්තන්ඩිය**



සේයා :-
ශ්‍රියංගනී
පිලීෂියා

## මාසික සිතිවිල්ල

"අගෝස්තු මාසය"

ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## සබත් දින වන ඉරුදින ශුද්ධ ලෙස ගත කරන්න.

⋆ **සබත් දිනය පිළිබඳව කතෝලික සභා ධර්මෝපදේශයෙහි සඳහන් වන්නේ කුමක්ද?**

- දෙවියන් වහන්සේගේ දවසයි.
- දෙවියන් වහන්සේගේ ගිවිසුමට සහභාගි වන දවසයි.
- සබත් දින ශුද්ධ ලෙස ගත කරන්න.
- ජේසුස් වහන්සේ මරණින් උත්ථාන වූ දිනයයි.
- එදින දෙවිඳුන්ට කැප වූ ගාම්භීර්යය දිනයක් ලෙස සැලකිය යුතුය
- දෙවියන් වහන්සේගෙන් ලැබුණු යහපත් දෙයට ස්තුති කරන දවසයි.
- ඉරුදින ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය මගින් ආරම්භ කළ නව මැවිල්ලේ දිනයකි
- දිව්‍ය පූජාව තුළින් කුරුසියේ ජේසු සමිඳුන් කළ ජීවිත පරිත්‍යාගයට අපි ද එක්වන දවසයි.
- ඉරු දිනත්, ණය මංගල්‍ය දිනත් රැකියාව , ව්‍යාපාර හා වෙනත් ක්‍රියාකාරකම් වලින් වැලැකිය සිටිය යුතුය.
- මෙදින දේව වන්දනාවට මුල්තැන දීම, එමගින් සතුට හා ප්‍රීතිය ලබාගැනීම හා මානසික, ශාරීරික විවේකය ලබාගැනීම සිදුවිය යුතුය. (ක.ස.ධ. 2168 - 2188)

✍ ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

⋆**තෙවන දේව පනතට විරුද්ධව අප සිදුකරන පාප කවරේ ද?**

- සිතා මතා ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි නොවීම
- දිව්‍ය පූජාව තුළ අවබෝධයෙන් නොසිටීම
- දිව්‍ය පූජාවට ක්‍රියාකාරීව සහභාගි නොවීම
- දිව්‍ය පූජා වේලාවේදී අනවශ්‍ය කථාවේ යෙදීම , පුවත්පත් බැලීම , උසුළු විසුළු කිරීම
- දහම් පාසල් නොගොස් දිව්‍ය පූජාව මගහැරීම , ටියුෂන් පන්තිවලට සහභගි වීම
- ඉරුදින අන් අයට උපකාර කිරීමට තිබූ අවස්ථා පැහැර හැරීම

⋆ **කිතුනු පාසල් දරුවෙක් ලෙස සබත් දින ශුද්ධ ලෙස ගත කිරීමට ඔබ ගන්නා පියවර තුනක් දක්වන්න.**

- ඉරුදින දිව්‍ය පූජාවට සහභාගී වීම
- වෙනත් දයාවේ කටයුතුවල නිරත වීම
- රෝගීන් බලන්නට යාම
- ආගමික සමිති සමාගම්වලට සහභාගී වීම
- ආගමික පොතපත කියවීම
- දහම් පාසලට සහභාගී වීම

## පියාට ද මවට ද ගෞරව කරන්න.

⋆ **සිව්වන දේව පනත කුමක් ද?** • තම පියාට ද, මවට ද, ගෞරව කරන්න.

- අප දෙමව්පියන්ට ප්‍රේම කරන්නට ද, ගරු කරන්නට ද, පාපයක් නොවන සෑම කටයුත්තකදී ම ඔවුන්ට කීකරු වන්නට ද ඔවුන්ට උදව් උපකාර කරන්නට ද මෙම පනතින් අපට නියම වෙයි.

⋆ **සිව්වන දේව පනත නික්මයාම පොතෙහි සඳහන් වන්නේ කුමන ආකාරයෙන් ද?**

- ''නුඹේ පියාට ද , මවට ද ගෞරව කරන්න. එවිට දෙවි සමිඳාණන් වහන්සේ නුඹට දෙන රටේ නුඹ බොහෝ කාලයක් ජීවත් වන්නෙහිය''. (නික්මයාම 20/12)

⋆ **සිව්වන දේව පනතට අනුව යුතුකම් හා වගකීම් රසක් පැවරෙන්නේ කාට ද?**

- දෙමව්පියන්ට
- දරුවන්ට
- පාලකයින්ට
- පුරවැසියන්ට

# ශුද්ධවූ පිලොමිනා මුනිතුමිය



සියලු දේ ත්‍යාජ කොට ගනිමින් සැබෑ දෙවිඳුන්ගේ අඩිපාරේ ගමන් කරමින් වද හිංසා ඉවසාලමින් ප්‍රාණපරිත්‍යාගී කිරුළ දිනාගනිමින් සමිඳු පා මුල පිපුණු සුවඳ කුසුමකී ශා. පිලොමිනා තුමීය. මෙතුමිය එතරම් ලොව ප්‍රසිද්ධියක් නොඉසුලුවත් මෙතුමිය ගෙන් අපට ගත හැකි ආදර්ශ එමටයි. අප දේශයේ එතරම් ජනප්‍රිය නොවූ ශු. පිලොමිනා තුමියගේ ජීවිත කථාව මෙලෙස ඔබ වෙත දිගහරින්නටයි මගේ මේ වෑයම ‘‘ශු. පිලොමිනා තුමියට යාච්ඤා කරන්න , ඔබ ඇයගෙන් ඉල්ලන ඕනෑම දෙයක් ඇය ඔබට ලබා දෙන සේක, ’’ මෙලෙස පැවසුවේ අති උත්තම xvi වන ග්‍රෙගරි පාප් වහන්සේයි.

කිතු දහම සත්‍ය ආගම බව දැඩිලෙස විශ්වාස කළ පිලොමිනා තුමිය ප්‍රාණපරිත්‍යාගි කිරුළ තුන්වන ශතවර්ෂයේ දී දිනා ගන්නා ලදී. එහෙම ටික කාලයක් යන විට ඇයගේ ශරීරය මිහිදන් කළ ස්ථානය හා ඇයගේ ශුද්ධවත් ජීවිතය ලෝකයාට අමතක වන්නට විය. එනමුදු දේව සැලැස්මක් මෙන් ක්‍රි.ව. 1802 දී රෝම නුවර ප්‍රාණපරිත්‍යාග වරුන්ගේ බිං ගෙවල් පරීක්ෂා කරන විට මෙතුමියගේ සොහොන් ගෙය ද සම්බ විය. සොහොන අසල වේලිච්ච ලේ සහිත කුප්පියක් දක්නට ලැබුණු අතරම ප්‍රාණපරිත්‍යාග වරුන්ට වද දීමට යොදාගත් උපකරණ ද, ජයගත් බවට ලකුණුද කැටයම් කර තිබුණි. ඇගේ ශරීරය මිහිදන් කළ ස්ථානයේ දී විවිධ වර්ගයේ ප්‍රාතිහාර්යයන් සිදු වූ හෙයින් පාප් වහන්සේ විසින් කල්නොයා එතුමියව සාන්තුවරයට ඔසවන ලදී. ඉහත සඳහන් කළ වේලුනු ලේ කුප්පියෙන් සියලු දෙනා විශ්මයට පත් වුයේ, එහි තිබූ ලේ පලිංගු පාත්‍රයට දමන විට ඇති වූ රන් රීදී , මැණික් වර්ණයන් සේ එය දිලිසෙනවා දුටු විටයි.

ශා. පිලොමිනා මුනිවරියගේ දෙමාපියන් මුල දී මිත්‍යාමත දෘෂ්ටින්ව සිටියහ. ඇයගේ පියා ග්‍රීක් රාජ්‍යයෙහි ආණ්ඩු කරමින් සිටින රජෙකු විය. මෙම දෙපල කෙතරම් මිථ්‍යා දේවතාවන්ට බිලි පූජා කරතත් දරුවෙක් නොමැතිව කනගාටු විය. ඒ අතර මාලිගාවෙහි සිටි කතෝලික වෛද්‍යවරයකුගෙන් කිතු දහම ගැන දැනගන්නා ලදී. දෙවියන් වහන්සේ තමනට දරුවෙක් ලබාදෙන විශ්වාසය පෙරදැරි කරගෙන කිතු දහමට පැමිණ යහපත් දූ කුමරියක් ලබාගන්නා ලදී. ආලෝකය යන අර්ථය ඇති පිලොමිනා නාමය ඇයට තැබූ අතරම ඇය මනා යහපත්ව අලංකාර ශරීරයකින් යුක්තව වැඩෙන්නට වූවාය. සතුරු වූ යුධ හමුදාවක් තම පියා ආණ්ඩු කරමින් සිටි ප්‍රදේශය අනිසි ලෙස අල්ලගන්නවා දැක ඇගේ මව්පියෝ එයට විරුද්ධව රෝම නුවර අගරජ වන දියොක්ලේසියානු වෙතට පැමිනෙන්නෝය. එවිට මැයගේ වයස අවුරුදු 13 ක් විය. දියොක්ලේසියානු නම් අගරජ ඇගේ මනරම් දුටුවන් වශී කරන රූපය දැක ඇය වෙත පෙම් බඳින්නට විය. අගරජ හෙතෙම ඉල්ලා සිටියේ ඇයව තමනට විවාහ කර දෙන ලෙසටයි. වස්තුවට, බලයට, මහිමයට තණ්හා වූ ඇගේ මා පියන් සතුටින් ඉපිලී ගියත් පිලොමිනා දැරිය මෙයට තදින්ම විරුද්ධ වන ලදී. ඇය දෙමා පියන් අමතා ‘‘මම මගේ කන්‍යා බව දෙවි ස්වාමින් වහන්සේට කැප කළෙමි. එසේ හෙයින් විවාහ වීමට නොහැකි’’ බව පවසන ලදී.

**බී.ඒ. මනෝජ් දිවන්ක**
**බණ්ඩාරවෙල**

ධනයට, බලයට, ආශා වූ දෙමාපිය දෙපළ ඈ වෙත වැඳ වැටී කඳුළු සලමින් ඇයගේ කැමැත්ත ගන්නට උත්සාහ දැරුවත් එය නිශ්ඵල විය. මගේ රාජ්‍ය නම් මෝක්ෂ රාජ්‍යය වේ යැයි ඇය කිව් සඳ මැය මෙම කටයුත්තට අකමැති බව පවසන්නට මා පියන් අගරජ වෙත ගිය නමුත් රජතෙම ඇය කැමති කරවාගන්නට උත්සාහ දැරුවත් සියල්ල අසාර්ථක විය. මහත් කෝපයෙන් ඇළලී ගිය රජතෙම ඈ විලංගු දමා සිරගත කරන ලදී. දිනපතා පාන් වතුර දී ඇයව තමාවෙතට නම්වා ගැනීමට වෙර දැරුවත් පිලොමිනා තුමිය ධෛර්යවත්ව නොසෙල් වී ස්වාමින් වහන්සේට හා දේව මාතාවන්ට යාච්ඤා කළාය. මෙසේ සිර ගෙදර දවස් තිස් හතක් ගත වූ පසුව දේව මෑණියන් දර්ශනය වී නුඹ මෙහි තව දින තුනක් සිටින අතරම පසුව නුඹට බොහෝ වද වේදනා විඳින්නට සිදුවන්නාහ. නමුත් බිය වන්නට එපා. මමත් රැකවල් දේවදූතයාත් ඔබ ළඟ සිටින බව පැවැසීය.

අගරජතුමාගේ සියලුම උපක්‍රම අසාර්ථක වනවා දැක ඈ ගල් කණුවක බැඳ තුවාල වන සේ තලන්නට අණ කළේය. ඉක්බිති ඈ මැරෙන බව සිතා හිරගෙට ගෙනයන්නට අණ කළ ද, දේවදූතවරු දෙදෙනෙක් ආලෝක විහිදුවාලමින් ඇගේ ශරීරයේ තුවාල සුවපත් කළේය. මෙයින් රජතෙම තවත් කෝපයට පත් ව කීබර් ගඟේ ගෙල වටා නැංගුරමක් දමා ගිල්වා මරන්නට අණ කළහ.

වධකයන් මෙසේ කරන විට දේවදූතයන් දෙදෙනෙක් පැමිණ නැංගුරම ද බැද තිබු ලණුද කඩා ඇයව ඔසවාගෙන ගං ඉවුරේ එගොඩට ගෙන යන ලදි. මේ ප්‍රාතිහාර්ය දුටු මිත්‍යාදෘෂ්ටිකයන් සිත හැරී කතෝලික දහම වෙත පියමැන්නහ. මහත් කෝපයෙන් ගිලිහි ගිය අගරජ රෝම නගරයේ එතුමිය ඇදගෙන ගෙන ගිය අතර ඊතල වලින් විදින්නට අණ කළ හෙයින් ඇගේ ශුද්ධ සිරුර තුවාල වී ලේ ධාරාවන් ගලා ගොස් මරණාසන්නව සිටියාය. එතුමිය නොමැරුණු බව දැනගත් රජ රත් වූ ඊතල වලින් විදින්නට වදකයන්ට අණ කළ ද තරමක් දුරගොස් ආපසු හැරී වධකයන්ටම ඒවා පැමිණි හෙයින් ඔව්හු මරණයට පත්වුහ. අවසානයේදී ඇයගේ ගෙල කපා දැමීමෙන් මරණයට පත්කරන ලදී. මෙසේ ශුද්ධවන්ත පිලොමිනා තුමිය, ප්‍රාණපරිත්‍යාගි කිරුළ හිමිකරගෙන මෝක්ෂ රාජ්‍යයේ සිටින්නාහ. ශුද්ධවර පිලොමිනා තුමියගේ මංගල්‍යය අගෝස්තු මස 11 වන දින සමරනු ලබයි.

**ලෝක ඔලිම්පික් තරගාවලිය තිස්වන වරටත් මේ දිනවල එංගලන්තයේ පැවැත්වේ. එංගලන්තයේ ලන්ඩන් නුවර දෙවන වරටත් පැවැත්වෙන මේ ඔලිම්පික් උලෙළට සමගාමීව ඔලිම්පික් ඉතිහාසය විමසා බලමු.**



ඉතිහාස තොරතුරුවලට අනුව ක්‍රිස්තු පූර්ව 776 දී ඔලිම්පික් නම් ග්‍රීක දෙවියා මුල්කරගෙන මුල්වරට ඔලිම්පික් තරග පැවැති බව කියැවේ. සියවස් 12 ක් එසේ පවත්වාගෙන ආවද ක්‍රි.ව. 393 දී තියොඩෝසියස් අධිරාජයා විසින් මිථ්‍යාදෘෂ්ටික දෙවි වරුන් තහනම් කරන ලදී. ග්‍රීසිය මේ අනුව ඔලිම්පික් තරගාවලියේ නිර්මාපකයා ලෙස සැලකේ. සියුස් දෙවියා සඳහා වන ආගමික උත්සවය සමගද ඔලිම්පික් තරග සමගාමීව පැවැති යුගයක් විය.

මුල් යුගයේ තරග අවසානයේදීම ජයග්‍රාහකයන්ට තිළිණ ප්‍රදනය කැරිණි. ග්‍රීක විනිශ්චයකරුවා ජයග්‍රාහකයාගේ දෑතට ඔලිව් අත්තක් තබත්ම නරඹන්නෝ ඔල්වරසන් හඬ දෙමින් මල් ඔහු වෙතට විසි කරති. ඔහුගේ හිසෙහි හා අත්වල රතු රිබන් පටි ගැට ගසනුයේ ජයග්‍රහණය සංකේතවත් කරන්නටය.

වර්ෂ 1894 දී බැරොන් පියරේ ඩිව්බටින් විසින් ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව පිහිටුවු අතර ඔලිම්පික් තරගාවලියේ සියලු නිල කටයුතු මේ කමිටුවට පැවරිණ. 20 හා 21 වන සියවස් වල දී විවිධ වෙනස්කම් වලට මුහුණ දුන් අතර සීත සෘතුවේ ඔලිම්පික් තරග ඇතුළත් වූයේද ඒ අනුවය. ලෝක මහා සංග්‍රාමයන් නිසා 1916, 1940 හා 1944 ඔලිම්පික් තරග පැවැත්වීමට නොහැකි වු අතර රුසියාව හා ඇමරිකාව අතර වු සීතල යුද්ධය හේතුවෙන් 1980 හා 1984 ඔලිම්පික් තරග වර්ජනය කිරීමේ තත්ත්වයක්ද උද්ගත විය. මෙවර ඔලිම්පික් තරගාවලිය පැවැත්වුණේ තිස්වන වතාවටයි. 2012 ඔලිම්පික් තරගාවලියට සමගාමීව එංගලන්තයේ කතෝලික සභාව රටවල් 205 කින් එරටට පැමිණි ක්‍රීඩකයන් පුහුණු කරුවන් , නිලධාරීන් සමග නරඹන්නන්ද පිළිගැනීමට සැදී පැහැදී සිටියෝය. වෙස්ට්මිනිස්ටර් ආසන දෙව්මැදුර ප්‍රමුඛව රටපුරා කතෝලික දෙව්මැදුරු ඔලිම්පික් සමාරම්භක උලෙළ හා



# ඔලිම්පික් කාහල නද මැද

බැඳෙමින් විනාඩි තුනක් එක දිගට සීනුනාද කරන්නට පියවර ගත්තේය. ඒ අතර සහභාගි වීමට පැමිණි අය ආගන්තුක සත්කාර මැද පිළිගැනීම සඳහා කතෝලික දේවස්ථාන කේන්ද්‍ර කර ගනිමින් විශේෂ මධ්‍යස්ථාන පවත්වාගෙන යමින් තිබේ.



ඔලිම්පික් උලෙළට දේවාශිර්වාද පතා ඔලිම්පික් ගම්මානය අසබඩ පිහිටි සාන්ත ප්‍රැන්සිස් අසීසි දෙව්මැදුරේ විශේෂ දිව්‍ය පූජා සංවිධානය කැර තැබු අතර දිවා කාලයේදී දිව්‍ය සත්ප්‍රසාද වන්දනාවත්, රාත්‍රියේදී දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදයත් සිදුකැරේ.

මේ අතර කිතුනු මූලයන් මුල්බැසගත් එංගලන්තයේ ඔලිම්පික්






# රැව්දෙන කතෝලික සාක්ෂිය

සමාරම්භක උලළෙන් ආධ්‍යාත්මික වටිනාකම් අමතක කැර හුදු වානිජ හා තාක්‍ෂණික අරමුණු ඔස්සේ පමණක් කටයුතු



කිරීමේ තත්ත්වය එරට ජනතාවගෙත්, ජනමාධ්‍යයන්ගෙත් දැඩි දෝෂ දර්ශනයට ලක්විය. පුරා සහස්‍රක දෙකකට අධික කාලයක් තිස්සේ එංගලන්තයේ කිතුනු උරුමය ගසට පොත්ත මෙන් එකට යාව තිබූ බවත් , දැන් පවා බහු තර ජනතාවකගේ ජීවිත වලින් කිතුනු හරයන් හා වටිනාකම් තුරන් වී නැතැයිද පෙන්වා දී තිබිණ. ඇතැම් මූලධර්මවාදීන් හා හුදු ලෞකික සැප සම්පත් කර පින්නාගත් ඊනියා පරිපාලකයන්ගේ වැරදි තීන්දු මත මේ කිතුනු උරුමය සඟවන්නට වෑයම් කළද එය සාර්ථක නොවෙන බැව් ජනතාව ප්‍රකාශ කරති.

මහා බ්‍රිතාන්‍යයේ බයිබල් සමාගම් 2012 ඔලිම්පික් උලෙළ ඉලක්ක කර ගනිමින් ක්‍රීඩා සුබාරංචි බයිබලයක් සම්පාදනය කැර තිබිණි. බොක්සිං ක්‍රීඩකයකු ජයග්‍රහණය පළකරන රුවකින් සුසැදි පිට කවරයකින් සමන්විත මේ බයිබලයේ ඉංග්‍රීසි පිටපත් තුන් දහසක් ද වෙනත් භාෂාවන්ගෙන් පිටපත් දහසක්ද ඔලිම්පික් ගම්මානයේ සංස්කෘතික කේන්ද්‍රයේ තබා ඇති අතර ඒවාට හොඳ ඉල්ලුමක් බවතින බවත් වාර්තාවිය.

ඔලිම්පික් සමාරම්භය සනිටුහන් කරමින් පැවති දේව මෙහෙය පැවැත්වූ වෙස්ට්මිනිස්ටර් අගරදගුරු අති උතුම් වින්සන්ට් නිකොල්ස් හිමිපාණෝ දෙවියන් වහන්සේ මවා වදාළ මිනිස් සිරුරේ මහිමය ලොවට ප්‍රකාශ කරන්නට මෙය අවස්ථාවක් වේවායි ප්‍රාර්ථනා කළහ. අතිඋත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ඔලිම්පික් උලෙළ ලොවට සාමය සහ ප්‍රතිසංධානය උදකරන මලල ක්‍රීඩා මහෝත්සවයක් බවත්, ලොව විවිධ ජාතීන් එක් නගරයකට කැඳවන ඒකත්‍වයේ සලකුණක් බවටත් පත්ව ඇතැයි පැවසීය.

මේ අතර එංගලන්තයේ ජෝසුවා මධ්‍යස්ථානයේ ඔලිම්පික් සමරුව සඳහා විශේෂ කුරුසියක් නිර්මාණය කර තිබේ. එහි තරුණ කැල මෙහිලා පුරෝගාමී ව සිටිති. වසර හතරකට වරක් උදවන ඔලිම්පික් තරගාවලියේ ගිම්හාන ක්‍රීඩා තරග ඉදිරි දිනවල අවසන් වුවද සීත ඍතු ඔලිම්පික් තරගාවලිය ඉන්පසු ඇරඹේ. ලොවම එකලු කරන ඔලිම්පික් උලෙළේදී පදක්කම් ලාභීහු කතෝලික විශ්වාසය ගැන කතෝලික දහමේ බලය ගැන පමණක් නොව කතෝලික පාසල් වලින් ලද විනය හා ක්‍රීඩා ශීලීත්‍වය ගැන නගන කාහල නාදය එංගලන්තයේ කිතුනු උරුමය සඟවන්නට වෙර දරන සැම තැති ගන්වනවාට සැක නැත.

ශිරාන් මෛත්‍රී

# ඉංග්‍රීසි පාඩම
## විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 65**

## "er සහ est" යොදා සංසන්දනාත්මක වචන සෑදීම

අපි ඉගෙන ගත් රීතිය අනුව පහත සඳහන් වැකි වලින් කියැවෙන තත්වයන් අපි කථා කළ අවස්ථා තුනෙන්ම,
**(Positive, Comparative සහ Superlative)**
යන තුනෙන්ම කියන්න අපහසු නෑ.

Suneetha is a **clever** girl. (Positive)
සුනීතා දක්ෂ ගෑණු ළමයෙක්.
Kanthi is **cleverer than** Suneetha. (Comparative)
කාන්ති සුනීතට වඩා දක්ෂයි
But mary is **the cleverest**. (Superlative)
ඒත් මේරි තමයි දක්ෂම
තව නිදසුනක් ගනිමු.
Sunil's table is **clean.** (Positive)
සුනිල්ගේ මේසෙ පිරිසිඳුයි
Anil's table is **cleaner than** Sunil's table.
අනිල්ගේ මේසෙ සුනිල්ගෙ මේසෙට වඩා පිරිසිඳුයි
But Nimal's table is **the cleanest**
ඒත් නිමල්ගෙ මේසෙ තමයි පවිත්‍රම

යම් තත්ත්වයක් ගැන කියන වචනයකට "er" හෝ "est" එක් කිරීමෙන් Comparative සහ Superlative යන සංසන්දනය කිරීමේ අවස්ථාවන් ඉංග්‍රීසියේදී සෑදෙන බව අපි ඉගෙන ගත්තා.

නමුත් මෙහෙම සන්සන්දනය කිරීමේ වචන හැදෙන්නේ **"er"** හෝ **"est"** යෙදීමෙන් පමණක්ම නෙමේ කියන කරුණත් මතක තබාගන්න. සමහර වචන වලට ඉදිරියේ more සහ most යන වචන යෙදීමෙන් අපි ඒ සන්සන්දනාත්මක අවස්ථාවන් ගැන කියනවා.
**more** කියන්නෙ වඩා (Comparative)
**most** කියන්නෙ වැඩිම (Superlative)
නිදසුන් වලින්ම අපි මේ ගැන ඉගෙන ගනිමු.

හැම වචනයකටම **"er"** හෝ **"est"** යොදන්නෙ නෑ. එහෙම නොයෙදෙන වචන වලට more හෝ most යන වචන දෙක යොදනවා.

beautiful කියන වචනෙ එක නිදසුනක්.
**beautiful** - ලස්සන (Positive)
**more beautiful** - වඩා ලස්සන (Comparative)
**most beautiful** - වඩාත්ම ලස්සන (Superlative)

තව නිදසුනක් Foolish - අඥාන Foolish - අඥාන (Positive)
**more** foolish - වඩා අඥාන (Comparative)
**most** foolish - වඩාත්ම අඥාන (Superlative)
හොඳයි අපි එවැනි වචන කීපයක් වැකි වල යොදල ඉගෙන ගනිමු.
The first sum is difficult (Positive)
(ද ෆස්ට් සම් ඉස් ඩිෆිකල්ට්) පළවෙනි ගාන අමාරුයි.
The second sum is **more difficult.** (Comparative)
(ද සෙකන්ඩ් සම් ඉස් මෝ(ර්) ඩිෆිකල්ට්)
දෙවැනි ගාන ඊට වඩා අමාරුයි.
The third sum is ***the* most difficult** . (Superlative)
(ද තර්ඩ් සම් ඉස් ද මෝස්ට් ඩිෆිකල්ට්)
තුන්වැනි ගාන තමයි අමාරුම.
අපි තවත් නිදසුනක් ගනිමු.
My brother is a courageous person. (positive)
(මයි බ්‍රදර් ඉස් අ කරේජස් පර්සන්)
මගේ සොහොයුරා හරිම ධෛර්යය සම්පන්න කෙනෙක්.
My Father is **more courageous** than my brother. (Comparative)
(මයි ෆාදර් ඉස් මෝ(ර්) කරේජස් දැන් මයි බ්‍රදර්)
මගේ සොහොයුරාට වඩා තාත්තා ධෛර්යවන්තයි.

But my mother is ***the* most courageous** person in our family.
(බට් මයි මදර් ඉස් ද මෝස්ට් කරේජස් පර්සන් ඉන් අව(ර්) ෆැමිලි)
ඒත් අපේ පවුලෙ වඩාත්ම ධෛර්ය සම්පන්න පුද්ගලයා තමයි අපේ අම්මා.
පසුගිය සතියෙ අපි "er" සහ "est" යෙදෙන වචන කීපයක්ම ඉගෙන ගත්තනෙ. අපි අද මේ more සහ most මුලට යෙදෙන වචන කීපයක් ගැන ඉගෙන ගනිමු. තවත් එකක්. මතක තියාගන්න මේ දෙවැනි අවස්ථාව ගැන වාක්‍යයකින් කියනවනම්
(වඩා හොඳයි, වඩා උසයි, වඩා ලස්සනයි.. වගේ) **"than"** (දැන්) කියන වචනය අනිවාර්යෙන්ම භාවිත වන බව මතක තියාගන්න.

# ශ්‍රී ලාංකීය මුද්දරයේ බ්‍රිතාන්‍ය රාජාවලිය

## මුද්දර ලෝකය



## හඳුනා ගනිමු

**පසුගිය කලාපයෙනි ....**

1901 දී වික්ටෝරියා රැජිනගෙන් පසු 07 වන එඩ්වඩ් රජුට බ්‍රිතාන්‍ය කිරුළ හිමිවිය. 1903 දී සිට 1910 දක්වා වු වසර 07 ක කාලය තුළ එතුමන්ගේ ශිර්ෂ රුව රැගත් මුද්දර 36 ක් අප රට මගින් නිකුත් කරන ලදී. 1910 සිට 1935 දක්වා පුරා වසර 25 ක් බ්‍රිතාන්‍යයේ රජකම් කළ 5 වන ජෝර්ජ් රජුගේ ශීර්ෂ රුව රැගත් මුද්දර නිකුත් කිරීම ආරම්භ විය. එම කාණ්ඩයේ ප්‍රථම මුද්දර ය 1912 දී ආරම් හවුනි. ලංකාවෙත් එවකට නිකුත්කළ වැඩිම වටිනාකම් සහිත මුද්දර නිකුත් වුයේ එම වකවානුවේදීය. මෙතෙක්කල් පැවති ප්‍රමාණයෙන් තරමක් විශාලවු එම මුද්දර සතර රු 50, 100, 500, හා 1000 සහිත වටිනාකමින් යුක්තවිය.

1914 ජුලි 28 සිට 1918 නොවැම්බර් 11 ද දක්වා පැවති පළමු ලෝක මහ සංග්‍රාමය වෙනුවෙන් වැයවු හා විනාශවු ආර්ථිකය ගොඩනැංවීම සඳහා මුල්‍යමය සංචිතයක් ගොඩ නැංවීම සඳහා අති මුද්‍රණ මුද්දර පෙළක් නිකුත් කරන ලදි. ( මුද්දරයක මූලික ස්වරූපය වෙනස් නොවන පරිදි එය මත යම් වචන , සංඛ්‍යා හෝ සළකුණු ආදිය එකතු කර නැවත නිකුත් කරන මුද්දර ''අති මුද්‍රණ මුද්දර'' ලෙස හැඳින්වේ ) මේ අනුව එකල ලංකාවේ භාවිතවු 05 වන ජෝර්ජ් රජුගේ මුද්දර කාණ්ඩයක් මත (war Stamds) හා ( war Stamb one .....) යන වදන නැවත මුද්‍රණය කර තිබුණි. මෙවැනි 'අති මුද්‍රණ මුද්දර'' පෙළක් ප්‍රථමයෙන් නිකුත් වූයේ 1918 නොවැම්බර් 18 වන දීය.

ශ්‍රී ලංකාව මූලාරම්භයේ සිට වසර 78 ක කාලයක් පුරා පැවති ඒකාකාරී මුද්දර සැලසුම් රටාව වෙනස් කරමින් අලුත් සම්ප්‍රදයක් වෙත අනුගත වුයේ 1935 මැයි 01 දය. ලාංකීය අභිමානය මුසු කරමින් ප්‍රථම වරට ලාංකීය දර්ශන පෙළක් සහිත මුද්දර 03 ක් එදින නිකුත් කරන ලදී. ඉන් එකක රබර් කිරි කපන්නියකගේ රුවක් (සත.02) , ගංගාවේ දර්ශනයක් (සත. 15) හා දළදා මාලිගාව (සත .25) දැක්වෙන රූප ඇතුළත්වු අතර ඉහළ එක් කෙළවරක 5 වන ජෝර්ජ් රජුගේ රුව කුඩාවට සිතුවම් කර තිබිණි.

එම රුව රජුගේ ඉදිරිපස දැක්වෙන ශීර්ෂ රුවක්වු අතර එතෙක් පැවති පැතිකඩ ශීර්ෂ ආකාරයෙන් බැහැර විය. එම මුද්දර පෙළට සමගාමීව 1936 වන විට එම කාණ්ඩයේම තවත් මුද්දර 08 එකතු කරනු ලැබීය. ඒවායෙන් දැක්වුයේ කොළඹ වරාය (සත.06) ත්‍රිකුණාමල වරාය (රු ½) පුරාණ වැවක් (සත.30) තේ දළු නෙලන්නිය (සත.09) , ශ්‍රී පාද කන්ද (සත.03) , වෙරළාශ්‍රිත පොල් ගස් (සත.20) වල් අලි (සත.50) , කුඹුරු යායක් (සත.10) යන දර්ශනයන්ය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම සමරු මුද්දරය නිකුත්වුයේ 1935 දීය. සමරු මුද්දරයක් යනු යම් සිද්ධියක්, සංවත්සරයක්, පුද්ගලයෙක් හෝ වැදගත් ස්ථානයක් සැමරීම වෙනුවෙන් නිකුත් කරනු ලබන මුද්දරයකි. එහි විශේෂත්වය වන්නේ එක් වතාවකට පමණක් එම නිකුත් වීම සිදුවීමයි. එනම් නැවත මුද්‍රණය ඉන් පසුව සිදු නොවීමයි. තවද , සමරු මුද්දර මුද්‍රණය කරනුයේ සීමිත ප්‍රමාණයක් වන බැවින් සෙසු මුද්දර වලට වඩා ඒවා ඉතා දුර්ලභ මුද්දර ඝනයට වැටේ.

මේ අනුව ප්‍රථම සමරු මුද්දර කට්ටලය ශ්‍රී ලංකාව විසින් 1935 මැයි 06 වන දින නිකුත් කළේය. 1910 - 1935 දක්වා පුරා 25 වසරක් බ්‍රිතාන්‍යයේ රජකම් කළ 5 වන ජෝර්ජ් රජුගේ පදවි ප්‍රාප්තියේ රිදී ජුබිලිය සැමරීම වෙනුවෙන් ශත 06 , 09, 20 , 50 , යන වටිනාකම් වලින් යුත් මුද්දර 04 ක් එදින දෙරට වැඩීය. බ්‍රිතාන්‍යයේ වින්ඩ්සර් රජ මාළිගයේ අනුරුවක් සහ රාජකීය ඔටුන්න පැළඳි පැතිකඩ ශිර්ෂයෙන් යුත් ජෝර්ජ් රජුගේ රුව එම මුද්දර හතරේම හැඩ ගන්වා තිබිණි.

මෙම මුද්දර කට්ටලයේ තවත් විශේෂ වැදගත් කමක් වනුයේ එකම තේමාවක් මුල්කරගෙන ලොවේ රටවල් කීපයක් මගින් පොදුවේ එකම ආරකින් නිර්මාණය කරන මුද්දර සඳහා ශ්‍රී ලංකාව තම ප්‍රථම දයකත්වය ලබා දීමයි. ඒ අනුව එම වකවානුවේ බ්‍රිතාන්‍යය යටත් විජිතයට අයත් සෑම රටක්ම පාහේ එම රිදී ජුබිලිය සැමරීම වෙනු වෙන් ඒ ඒ රටවල් හඳුන්වන නාමය පමණක් ඇතුළත් එකම ආරයට සැලසුම් කළ මුද්දර තම රටවල් මගින් නිකුත් කෙරුණි.

**මීළඟ කලාපයට .....**

**✍ සිරිල් පෙරේරා**



**ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලැබීම**
**ඈන් රෙෂ්නි ගමගේ**
04 ශ්‍රේණිය
ලූර්දු මාතා දහම් පාසල
නාත්තන්ඩිය



**දිය ඇල්ලක්**
**ක්‍රිෂ්මා නිමාෂා**
07 ශ්‍රේණිය
මරිය රාජිණී කණිෂ්ඨ විදුහල - කටාන

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**දේව මෑණියෝ**
**දුලාජ් චංදිම අමරතුංග**
06 ශ්‍රේණිය
උත්ථානවූ කිතු සමිඳුන්ගේ
දහම් පාසල - දංකොටුව



**අපේ නිවස**
**සත්රූ දිනෙත් ප්‍රනාන්දු**
01 ශ්‍රේණිය
රෝමානු කතෝලික කනිටු විදුහල
කමරාගොඩ



**ජේසුස් වහන්සේ මැවූ ලෝකය**
**සසිදු අයෙෂ් ප්‍රනාන්දු**
01 ශ්‍රේණිය
ශාන්ත. රිතා දහම් පාසල - මාවිළිය
(ජා-ඇල මීසම )



**අති උතුම් සොලොස්වන බෙනඩික්**
**සුදතුම් පියාණෝ**
**විහංගි මධුකලා**
05 ශ්‍රේණිය
බ/සීවලි නවෝද්‍යා මහ විදුහල
බණ්ඩාරවේල



**පරිසරයේ අසිරිය**
**සිත්මල් උදන සිල්වා**
02 ශ්‍රේණිය
ශා. රෝගුස් දහම් පාසල
දෑලතුර



**ජුසේවාස් පියතුමා ලංකාවට**
**ගොඩබැසීම**
**සහන් නිර්මල**
09 ශ්‍රේණිය
සා. ආනා දහම් පාසල
බොරලැස්ස



# පළදායි සේවයට විවේකය අවශ්‍යයි



**පොඩි ෆාදර් ලියයි**

ගරු නිරංජන් විජේරත්න (සා. බෙ. නි.) පියතුමා

ආදර දුවේ, පුතේ, දැන් දෙවන පාසල් වාරය අවසන් වෙලා පුංචි ඔබට නිවාඩු ලැබිලා. මේ නිවාඩු කාලය පළදායි ලෙස ගත කරන්න ඔබේ මනසට හොඳ විවේකයක් ගන්න එවිට අවසාන වාරයේ අධ්‍යාපන කටයුතු හොඳට කරන්නට ඔබට හැකියාව ලැබෙනවා. නොඅනුමානයි. මේ සඳහා මම ඔබට ලස්සන කතාවක් කියන්නම්.



එක්තරා තාපස නිකායක ප්‍රධාන තාපසතුමා තරුණ තාපසයන් දෙදෙනෙකුට නිකාය සතු ගොවිපලේ කාර්යයන් පැවරුවා. එම දෙ-දෙනාට නියම වී තිබුණේ ගොවිපලේ තිරිගු අස්වැන්න කපා මිටි බැඳ ධාන්‍ය ගබඩාවෙ එක් රැස් කිරිමයි. පළමු තාපසයා ඉතාමත් කඩිනමින් කඩිසරව නොනවත්වාම තමාට නියම කොටසේ අස්වැන්න නෙළීමේ කාර්යය කරන්නට පටන් ගත්තා. ඔහු කිසිම විරාමයක් ගත්තේ නැහැ. නමුත් දෙවන තාපසයා හැම පැයක් අවසානයේම විරාමයක් ගනිමින් තම කාර්යය ඉටු කරන්නට වෙහෙසුනා. සෑම පැයකදිම මෙවැනි විරාම ගෙන කටයුතු කිරිම වැරදි දෙයක් ලෙස පළමු තාපසයා දුටුවා.

දවස අවසාන වුනා දෙදෙනාම තමාට නියමිත කොටසේ අස්වැන්න කපා මිටි බැඳ තිබුණ නිසා එම අස්-වැන්න සංසන්දනය කරන්නට පටන් ගත්තා. ප්‍රථමයෙන් පළමු තාපසයාගේ අස්වැන්න මිටි ප්‍රමාණය ගණන් කර බැලුවා. දෙවැන්නාගේ මිටි ප්‍රමාණය පළමු වැන්නාට වඩා වැඩියෙන් තිබුණා. පළමුවන තාපසයාට පුංචි ඊර්ෂ්‍යාවක් දැණුනා. ඒ වගේම පුදුමයටත් පත් වුනා.ඔහු තම සගයා ගෙන් මෙසේ ප්‍රශ්න කළා. මම කිසිම විරාමයක් නොගෙන දිගටම වැඩ කළා. ඒ නිසා මම නෙලූ අස්වැන්න වැඩි විය යුතුයි. ඒත් ඔබ සෑම පැයතදීම විරාමයක් ගත්තා. ඔබගේ අස්-වැන්න වැඩි වන්නට හේතුව කුමක්ද? ඔබ මගේ අස්වැන්න සොරකම් කළාවත්ද? දෙවන තාපසයා එවිට මෙසේ කිව්වා. මිත්‍රය, මම මොකටද ඔබගේ අස්වැන්න සොරකම් කරන්නේ? ඔබ සිටියේ මට වඩා ඈතින්. ඉතිං මම කොහොමද සොරකම් කරන්නේ. මෙන්න මේකයි මම විරාමයක් ගත්ත සෑම පැයකදිම මගේ දෑකැත්ත මුවහත් කරනවා. එවිට අස්වැන්න වැඩියෙන් හා ඉක්මනින් කැපෙනවා. ඔබත් එසේ කළානම් ඔබටත් මං වගේම තව මිටි රාශියක් කපා ගන්නට තිබුණා. යයි ඔහු පැවසුවා.

ආදර දරුවෙනි, ඇතැම් විට ඔබ කිසිම විවේකයක් නොගෙන එක දිගටම වැඩ කරගෙන යනවා. උදේ පාසලේ හවස පංතිවල. රෑ නිදි මාරාගෙන පාඩම් කරනවා. හැබැයි අවසානයේ කිසිම දෙයක් මතක නෑ. අවසානයේ ඔබ කරන කිසිම දෙයක සාර්ථකත්වයක් නෑ. අවසානයේ කිසිම ප්‍රතිඵලයක් දකින්නට නැ පංති ගියා සල්ලි වියදම් කළා ඒත් විභාගය අසමත් හේතුව මොකක්ද, විවේකයක් නැතිව එක දිගටම වැඩ කළාට පාඩම් කරපු කිසිම දෙයක් හිතේ ධාරණය වෙලා නෑ. අප කරන හැම වැඩ කටයුත්තකදිම විරාමයක් ගැනීම ශාරිරික වශයෙන් පමණක් නොව මානසික වශයෙන්ද පලදායි ක්‍රියාවක් වෙනවා. සතියකට වරක් ඉරිදා දිනයේ නිවාඩු ගැනීම අප ශරීරය ට හිතකර දෙයකි. ඒ දිනයේදී දෙවිඳුන් නැමදිම අධ්‍යාත්මික වශයෙන් අප ලබන පෝෂණයයි. තවත් කැපවී ක්‍රියා කරන්නට හා සේවය කරන්නට එමගින් අපට ශක්තිය ලැබෙනවා. අද බොහෝ දරුවන් ඉරිදත් ටියුෂන් පංති යනවා. ඉරිදා දිව්‍ය පූජාවට , දහම් පාසලට එන්න වෙලාවක් නෑ. අවසානයේ බැලුවාම කිසිම දෙයක් ලබාගෙන නෑ. දරුවා නොමග ගියා පමණක් නොවේ විභාගයත් අසමත්. ජේසුස් වහන්සේ පවා තම දූත මෙහෙවරේදි විවේක ගත් බව සුවිශේෂයේ සඳහන් වෙනවා. ශ්‍රාවකයන්ට පවා උන්වහන්සේ උපදෙස් දුන්නා ''ශ්‍රවකයෝ ජේසුස් වහන්සේ වෙතට රැස්ව තමන් කළ සියල්ල උන්වහන්සේට සැළකළහ. එවිට උන්වහන්සේ කතා කරමින් ඔබ පමණක් වෙන්ව හුදකලා තැනකට අවුත් මද වෙලාවක් විවේක ගන්නැයි ඔවුනට වදාළ සේක. එසේ කීවේ ඔවුනට කෑම කන්නවත් අවකාශයක් නැති තරමට යන එන අය බොහො බැවිනි. එවිට ඔවුහු පමණක් ඔරුවෙන් හුදකලා තැනකට ගියෝය. (මාක් 6/30-32)

ඉතින් දරුවෙනි එම නිසා මේ නිවාඩු මාසයේ විවේක ගන්න. ජීවිතයේ වැරදුන තැන් හදා ගන්න උත්සාහ කරන්න. විභාගයෙදී අඩුවෙන් ලකුණු ලැබුණ විෂයන් සඳහා වැඩි උනන්දුවක් දක්වන්න. වැඩි වශයෙන් දිව්‍ය පූජාවට සහභාගි වෙන්න . ජේසුව ලබා ගන්න වැඩියෙන් යාච්ඤා කරන්න ජේසු වෙතට වඩාත් ළංවෙලා හොඳ දරුවෙක් වෙන්න උත්සාහ කරන්න

ඔබ හට ප්‍රසන්න දරුවෙක් වන්නට ජේසුනි දිරි දෙන්න

ඔබ හට ප්‍රසන්න දරුවෙක් වන්නට ජේසුනි මා හට ළං වෙන්න

**ඔබට ජේසු පිහිටයි**

# ප්‍රහේලිකා අංක 32

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | | 2 | ■ | 3 |
| | ■ | ■ | | ■ | |
| | ■ | ■ | 4 | 5 | |
| 6 | 7 | | ■ | | ■ |
| ■ | | ■ | 8 | | |
| 9 | | | ■ | | ■ |

( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )

**හරහට**

1. මෙම කාලයේදී විශේෂයෙන් ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය සිහි කරනු ලබයි.

4. අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් අතරින් උන්වහන්සේ ප්‍රේම කළ තැනැත්තා උන්වහන්සේගේ .......... ළංව හාංසි වී සිටියේය මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ක්‍රිස්තුන් වහන්සේ බොහෝ අවස්ථාවලදී මොවුන් වැඟී සිටි අයට සුවය ලබාදුන් සේක.

8. ක්‍රිස්තුන් තම කන්ද උඩ දේශනයේදී ........... හා විපත පිළිබඳව විස්තර කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

9. ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයන් අතරින් ජුදස් පොදු ............ පසුම්බිය බාරව සිටියේය මෙහි හිස්තැනට සුදුසු වචනයට සමාන වචනයකි.

**පහළට**

1. අල්ලස් ගැනීමෙන් මෙය දූෂණය වන බව ධර්ම දේශකයා පවසයි.

2. ක්‍රිස්තුන් වහන්සේව කුරුසියේ ඇණ ගසන පිණිස ........... පිටිය යන අර්ථය ඇති ''ගොල්ගොතා'' නම් ස්ථානයට ගෙන ගිය සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගැසු පසු මද්දහනේ සිට අපරභාග .............. පමණ උන්වහන්සේ ''මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මන්ද?'' කියා මොර ගැසුහ. මෙහි හිසතැනට සුදුසු වචනය

5. එක් ධනවත් ප්‍රධානියෙක්, උන්වහන්සේට කථා කොට, ''............. ගුරු දේවයනි, සදාතන ජීවිතය උරුම කර ගන්නට මා කුමක් කළ යුතුදැ''යි ඇසිය. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. ජෙරමියා දිවැසිවරයාට දෙවියන් වහන්සේ මෙසේ වදාළ සේක. ''ඊශ්‍රායෙල් ජනයෙනි, .......................... කරු අතේ තිබෙන මැටි පිඩක් මෙන් නුඹලා මාගේ අතේ සිටින්නාහුය. හිස් තැනට සුදුසු වචනය.

**(මෙම ප්‍රහේලිකාව පිරවීමේදී පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. මාක් 15/22, , ශු. ලූක් 6/ 20 , 18/18 , ශු. ජුවාම් 13/ 23 , 13 / 29 , ජෙරමියා 18 /6 , ධර්මදේශකයා 7 / 7)**




වැලිවිට ශාන්ත මරියා දේවස්ථානයට අනුබද්ධිත යහපත් එඬේරාගේ සිඟිති පාසලේ දූ දරුවන් විසින් පවත්වන ලද 2012 වසරේ සිඟිති පොළ දේවස්ථාන භූමියේදී පසුගියදා සාර්ථකව පවත්වන ලදි.

සිඟිති පාසලේ විදුහල්පතිනි ගරු මාරි සුමුදු පැවිදි සොයුරියගේ අනුශාසකත්වයෙන් දෙමාපියන්ගේද සහයෙන් ගුරු මෙනෙවියෝ එක්ව මෙය සංවිධානය කළහ.

**එම්.ජෝ. පාරිස්**



දුන්ගාල් පිටිය දොන් බොස්කෝ ආයතනයේ, ළදරු පාසලේ සිඟිති පොළ පසුගියදා පැවැත්වුණි. එහිදී ගරු නිරෝෂන් ප්‍රනාන්දු පියතුමන් විසින් ළමුන්ගේ පළතුරු මිලදී ගන්නා අයුරු ළමා ප්‍රදීපය කැමරාවට හසුවූ අයුරු මෙහි දිස්වේ. **සෙබස්තියන් පෙරේරා**

## දහම් ළමුන්ට ක්‍රීඩා උළෙලක්



කළමුල්ල මීසම් සේවක, ගරු මොරිස් නාමල් සහයක ගරු දුලිප් කමල් යන පියතුමන්ලා ගේ සහ කටුකුරුන්ද දහම් පාසල් ගුරු මඬුල්ලෙහි අදහසකට අනුව කටුකුරුන්ද දහම් පාසල් ළමුන් සඳහා නිවාසාන්තර ක්‍රීඩා උළෙලක් සංවිධානය කෙරිනි. මෙදින ප්‍රධාන ආරාධිතයාණන් ලෙස කළුතර දිසා දහම් පාසල් අධ්‍යක්ෂ ගරු ඉෂාන් ප්‍රමින පියතුමා සහභාගී වුණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**සඳමාලි සිල්වා**


රජ කුමාරයයි කිඳුරු කුමාරියයි
ආනන්ද කල්දේරා රචනා කාරයි
දෙබස් හා සිතුවම් ඇස්.ඒ.ඊ. සදුආරච්චිය
10
ඒත් එදා රෑ වෙන්න ගන්නව.. මුහුද හරිම අමුතුයි.. වේගයෙන් මුහුදු රළ ඉහළ නැගෙන්න වුනා
සරස්...
කොහොම උනත් ලුස්සරින්ද රෑ හොඳටම නිදිමරල විනෝද වුන කුමාරවරුන්ට තදටම නින්ද ගිහිං තිබුනෙ.. ඒ ගොල්ලො මේ කිසිදෙයක් දන්නෙ නෑ..
කිඳුරු රැජිනගෙ මායා බලයෙන් මුහුදේ රළ අඩි ගාණක් උසට නගින්න වුනා.. ඒ
සමගම මහා සුළං කුණාටු චණ්ඩියක් ඇද හැලුනා...
එන්න එන්නම මුහුද රළු වුනා... පළාතම අන්ධකාරයි... මහ හඬින් විදුලි කොටල හෙණ ගහන්න පටං ගත්තා...
බය අතරෙ වේගයෙන් එහාට මෙහාට පැද්දෙ මින් තිබුන.. කුමාරවරු සිටින නැවට මහා විශාල ජල කඳක් පාත් වුනා..
අපා.. යාලුවනේ නැගිටින්න.. මහා විශාල අනතුරක්

**දෙවන කොටස** *දඟකාර ළමයෙකු හොඳ ළමයෙකු වූ කතාව......*

සැකසුම : තිළිණ අලහකෝන්

